දුහි සන්නස කලාපයෙහි පළමු කොටස හා බැසේද

මව්බිමෙන් සංක්‍රමණය වූ නැතහොත් ආනයනය කරන ලද තවත් ආසාදනයක් ගැන කිහිප වතාවක්ම සඳහන් කළෙමි. ඒ ගැන යළිත් අවධාරණය කළ යුතු යැයි මා කල්පනා කළේ මෑතක මා අතට පත් පොත් පිංචක් කියවීමේදී ය. තායිලන්තයේ ප්‍රකට භික්ෂුවක් වූ අජාන් චා හිමිගේ ''වනාන්තරයේ ගසක් '' නම් පොතක් ජ්‍රදීප් කුමාර බාලසූරිය විසින් සිංහලට නඟා ඇත. පරිවර්තකයා ලිහිල් සිංහලෙන් දක්වන අදහස් අනවශ්‍ය විච්ඡුරණයක් නිසා පටලවා ගෙන ඇති සැටි දුටුවෙමි. ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙකුට පුරුදු වී ඇති අරුම පුදුම කර්මකාරක රෝගය ඔහුටත් වැළඳී ඇති සැටි පොතේ මුල් පිටු කිහිපයෙන්ම අනාවරණය විය. මුල් පිටු පහක් හයක් හමාර කරන්නට පළමු මට හසු වූ නිදසුන් කිහිපයක් මෙහි සඳහන් කරමි.

1. වසර ගණනාවක්ම උන් වහන්සේ තායිලන්ත වනාන්තරයක තපස් ජීවිතයක් ගෙවූ අතර දානය සපයා ගනු ලැබුවේ පිඬු සිඟා වඩිමිනි. (දානය සපයා ගත්තේ නැතහොත් ලබා ගත්තේ යැයි කීවා නම් අර්ථය පැහැදිලි ය.)

2. එහෙයින් බුදුන් වහන්සේගේ දෙසුම් වලට අප සිත ගෞරව කරනු ලබයි. (ගෞරව නොහොත් ගරු කරයි කියන්නට බැරි ඇයි?)

3. අප එය අධ්‍යනය කරයි. ප්‍රායෝගිකව උපයෝගී කරගනු ලබයි. (කිව යුත්තේ අපි අධ්‍යයනය කරමු. ප්‍රායෝගිකව උපයෝගී කර ගනිමු- යන්නයි.)

4. එහෙත් රෝගියා තව දෙයක් නොනවත්වාම කරනු ලබයි. (කරයි කීවා නම් සෑහෙයි.)

5. එක් එක්කෙනාගෙ හදවත ක්‍රියා කරනු ලබන්නේ ඒ ඒ පුද්ගලයා ට අනුව ය. (හදවත ක්‍රියා කරන්නේ විය යුතුය.)

6+7. බොහෝ දරුවන් ක්‍රියා කරනු ලබන කෙළි සෙල්ලම් වැඩිහිටියන් පීඩාවට සේම කරදරයට පත් කරවයි. එහෙයින් වැඩිහිටියන් නිබඳවම කරනු ලබන්නේ දරුවන්ට බැණ වැදීමය. (මේ දෙතැන කරන හා කරන්නේ යනුවෙන් නිදොස් විය යුතුය.)

මේ ටික උපුටා දැක්වූයේ මෙය කෙට එළඳෙනගේ දිවිල්ල වාගේ ව්‍යායාමයක් වන හෙයිනි. සිංහල ව්‍යාකරණ පොත් වල ජෙග් ප්‍රයෝග නමින් ව්‍යවහාර විධියක් ඇත. එයින් අදහස් වනුයේ ප්‍රවීණයන් නොහොත් පඬිවරුන්ගෙ යෙදුම් යන්න ය. සම්මත ව්‍යවහාරයට අනුකූල නොවූවත් වියතුන් විසින් භාවිතා කරනු ලැබීම නිසා යම් යම් යෙදුම් සම්මත ව්‍යවහාරයට පත් වන බවය, එයින් කියැවෙනුයේ. මෙම කර්මකාරකයේ නම් ඒ කියන විදියේ වියත් වහරක් ගැවිලාවත් නැත. සිංහල වාක්‍යයක් කර්තෘ කාරක හා කර්ම කාරක යනුවෙන් දෙවර්ගයකට ඇතුළත් කළ හැකිය. කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හරවන්නේ අවධාරණය අතින් හෝ අන් විදියකින් හෝ එය වෙනස් කළ යුතු වූ විටක ය. මෙම නව ප්‍රවණතාවෙන් ප්‍රකට වන්නේ එබඳු අවශ්‍යතාවකට දක්වන ප්‍රතිචාරයක් හෝ ප්‍රවීණයන් අතින් භාවිතයට පත් කැරුණු දෙයක් හෝ නොවේ. කොහේ හෝ මනස්ගාතයක් අනුකරණයෙන් කරනු ලබන විකාරයක් පමණි. එමගින් වැකියක අදහස සුගම වීමක් හෝ වියත් විදියට ඉදිරිපත් වීමක් හෝ සිදුවන්නේ නැත. එකම ආනිසංසය අනවශ්‍ය ව්‍යාකූලතාවක් එයට ආරෝපණය කිරීම පමණි.

ශ්‍රී ලංකාවේ මහාචාර්යවරුන් දෙදෙනකුගේ සිංහල ගැන මම පහන කලාප දෙකකම ලියුවෙමි. එක් කෙනකු දැන් විශ්‍රාම ගෙන ඇත. යටත් පිරිසෙයින් තවමත් සේවයේ නිරතව සිටින මහාචාර්යවරයා ඇතුළු ඔහුගේ මට්ටමේ සිංහල උගත් ආචාර්ය මහාචාර්යවරුන් සියලු දෙනාම සරසවි අධ්‍යාපනය ඇතුළුව සමස්ත අධ්‍යාපනයම සිංහල මාධ්‍යයෙන් හමාර කළවුන් බව කිව හැකිය. තනිකර සිංහලෙන් උගත් මෙබඳු පුද්ගලයන් වැඩිදෙනා මූලික වියරණ විදි පවා අනුගමනය කිරීමට අපොහොසත් වීම අදහාගන්නට පවා අපහසු වන්නේ මගේ යුගයේ සිංහල උගතුන් ගැන සිතන විට ය. ඔවුනතුරින් මා වැනි සමහරු සිංහල ඉස්කෝලේ මූල සිට අග දක්වා ඉගෙන ගෙන ඉංග්‍රීසි මාධ්‍යයට ප්‍රවිෂ්ට වූවෝ ය. ඒ සියලු දෙනාම තෘතීය අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලද්දෝ වූහ. මා සරසවියේ ගත කළ සිවු වසරෙන් මුල් තුන් වසරේම අපට සිංහල ඉගැන්වූයේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. තනිකර සිංහලෙන් ඉගැන්වීම පටන් ගත්තේ අවසාන වසරේය. මේ කාරණය අවධාරණය කරන්නේ අපගේ සුපිරි බවක් කියන්නට නොවේ. මගේ පරපුරේ බොහෝ දෙනාට වඩා වත්මන් පරපුරේ සියල්ලන්ම පාහේ බුද්ධිමත් බව මම අවංකව ම පිළිගනිමි.

මා කියන්නට යන වෙනස නොහොත් ඌනතාව කනගාටුදායක වන්නේ ද එනිසාම ය. මගේ පරපුරේ ලේඛකයෝ කිහිප දෙනෙක් අදත් ජීවතුන් අතර සිටිති. සමහරෙක් මා මෙන්ම සිංහලෙන් ජ්‍යෙෂ්ඨ විභාගය නොහොත් ඊට ඉහළ විභාග ද සමත් වූවෝ ය. ඒ පරපුරේ සිංහල ලිවීමට යොමු වූවන් වෙතින් මා දුටු හා අදත් දකින ලක්ෂණයක් වනුයේ ඔවුන් පහසුවෙන්ම මූලික වියරණ රීති පිළිපදිමින් ලිවීමට සමත් වීමය. අර මහැදුරන් ගැන මා සංවේගය පළ කළේ ඒ නිසාම ය. සිංහල ලිවීමට යොමු වූවන් පමණක් නොව, වෙනත් අංශ වලට යොමු වූවන් ද මට මතක් කළ හැකිය. ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගෙන ඉංග්‍රීසියෙන්ම විද්‍යා උපාධිය ලබා ගත්තෙකි. දැනට වසර තිහ හතළිහකට උඩ දී තරුණ විද්‍යා ගුරුවරයකු වශයෙන් මට මුණගැසෙන විටත් ඔහු වෙතින් පළවුණු විශේෂ ලක්ෂණයක් මට අමතක නොවෙයි. අප බොහෝ දෙනා කතා බහේදී ඉංග්‍රීසි වචනයක් හෝ වගන්තියක් අතරින් පතර යොදා ගනිද්දී පවා එකද ඉංග්‍රීසි වචනයක් භාවිතා නොකර තනි සිංහලෙන් කතා කිරීමේ රුචියක් පමණක් නොව පුදුමකාර හැකියාවක් ද ඔහු වෙතින් පළ විය. අදත් ඔහු වෙනස් වී නැතැයි සිතමි. නිවැරදි සිංහල ලිවීමට සිංහල උපාධියක් අනවශ්‍ය බව පුන පුනා තහවුරු කරන තවත් විද්‍යාඥයෙක් ඇත. මගේ යට කී පහන ලිපි දෙකෙහිම ඔහුගේ ආදර්ශය ගෙන හැර පෑවෙමි.

කැළණිය සරසවියේ සිංහල මහාචාර්යවරයා වියරණ වරද්ද වරද්දා ලියන අතර වාරයේ එම සරසවියේ ම ගණිතය පිළිබඳ මහාචාර්ය ධූරය හොබවන මෙම විද්‍යාඥයා - එනම් මහාචාර්ය නලින් ද සිල්වා වියරණ නොමරා විවිධ මාතෘකා යටතේ සතිපතා ලියන බව මම අවධාරණය කළෙමි.

මේ දෙදෙනාම මගේ පරපුරට ඇතුළත් කිරීමට මම නොකැමැත්තෙමි. මගේ පරපුරෙන් දැන් ඉතිරි වී ඇත්තේ ඉතා අල්ප ගණනකි. ඒ අතර ප්‍රකට සිවිල් සේවකයන් ද සිටි බව සඳහන් කළ යුතු ය. මා කියන සිවිල් සේවකයෝ සිංහල ලේඛකයෝ ය. මේ සියලු දෙනාම කතා බහේ දී යොදා ගත් ඉංග්‍රීසි කෑලි තිබුණ ද, යට කී ආකාරයට නිවැරදි බසින් ලියනවා හැරෙන්නට අනවශ්‍ය ඉංග්‍රීසි වචන හෝ යෙදුම් භාවිතයට නොපෙළඹුණ හ.

අද ශ්‍රී ලංකාවේ පොත පත ලියන උදවිය මෙන්ම පුවත්පත් වල සේවය කරන්නන් ද අතර සිංහල උපාධිධාරීන් සෑහෙන ගණනක් ඇතැයි ද සිතමි. අර සිංහල මහාචාර්යවරයා විසින් ප්‍රදර්ශනය කරන ලද දුබලතාව සමහර සරසවි ඇදුරන්ගෙ පමණක් මෙම උපාධිධාරීන් වැඩිදෙනාගෙ ද පොත්පත්හි ප්‍රදර්ශනය වන බව කියන්නේ හුදෙක් යථා තත්ත්වය අවධාරණය කිරීමට පමණි. ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබුවන් වෙතින් පළ වූ නිවැරදි සිංහල ලිවීමේ හැකියාව මොවුන්ගෙන් ගිලිහී ගියේ කෙසේ ද යන්න සොයා බැලීම පිටරටක සිටින මා වැන්නන්ට කළ හැකි විතුමයක් නොවේ. අපට කළ හැක්කේ ඇසෙන තැනෙකට ඇසෙන්නට - පෙනෙන තැනකට බලාගන්නට - මේ අවාසනාවන්ත තත්වය කියා පෑම ය.

පුවත්පතක කරන තරමක් විස්කම් කරනුයේ භාෂාව ඔස්සේ ය. සිංහල පුවත්පතේ සිංහල හරියට ලිවීමට බැරි උදවිය සිටීමෙන් විය හැකි හානිය අමුතුවෙන් කිව යුතු නොවේ. සමහර පත්තර කතුවරුන්ටත් නිවැරදි සිංහල ලියන්නට බැරි බවක් ශ්‍රී ලංකාවේ මහාචාර්යවරයෙකු ප්‍රකාශ කළ බවක් මට කියවන්නට ලැබුණේය. මොවුනතුරින් පුද්ගලිකව මා හඳුනන්නන් කෙනකු දෙන්නකුවත් නැති නිසා මේ ගැන හරියට යමක් කීමට අසමත් වෙමි. සිංහල පත්තර වල පළ වන ලිපි අනුව නම් ඒ ගැනත් සැක පහළ වන බව කිව යුතුය. මේ රටේ පළවන පුවත් පත් සඟරා ගැන අමුතුවෙන් කිව යුතු නැත.

මෑතදී මේ රටට පැමිණි විශ්‍රාම ලත් සිංහල මහාචාර්ය වරයෙක් මට මුණ ගැසුණේ ය. ඔහු සිංහල වියරණ ගැනත් පොතක් දෙකක් ලියුවෙකි. ප්‍රකට ලේඛකයෙකි. මේ රටේ ප්‍රකාශන කිහිපයක් කියවා තිබූ ඔහු මගෙන් ප්‍රශ්නයක් ඇසුවේය.

" ..නිවැරදි සිංහල ලියන අය නැහැ නේද? "

මම එය ආපසු හරවා ගැසුවෙමි. " ...ශ්‍රී ලංකාවේ පත්තර වල වගෙ තමයි. එහේ ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් සිංහල ඉගෙන ගත්ත අයනේ... "

මහාචාරයවරයාගෙන් තවත් ප්‍රශ්නයක්.

"...දැන් මෙහේ සිංහල උගන්වනවා නේද?.. "

ඒකටත් අර වගේම පිළිතුරක් නොදී ඉන්නට බැරි නිසා, මම : " ඒ උගන්වන්නෙත් ශ්‍රී ලංකාවේ සිංහල උගන් වන පරපුරේම අයගෙ උදවියනෙ. ඔය දෙගොල්ලන්ටම ඉගැන්නුවෙ ශ්‍රී ලංකාවෙ ආචාර්ය, මහාචාර්යවරු නේද? "යන පිළිතුර දුන්නෙමි.

ඔහු මා සමඟ තර්ක නොකළේ යථා තත්ත්වය අත්දැක ඇත්තකු නිසාය. මා සමඟ කතාබහ කරන අතරවාරයේ ඔහු හොඳ අදහසක් ද පළ කළේ ය. එය අදහසකටත් වඩා වැදගත් ය. තමා සිංහල වියරණ ගැන පොතක් ලියන්නට අදහස් කරන බව ය. එය ඉංග්‍රීසියෙන් ලිවීමට තීරණය කරගෙන සිටින බව සඳහන් කළ විට මම එය අනුමත කොට ඔහු දිරිමත් කළෙමි. දැන් සිංහලට ඒ තරම් සැළකිල්ලක් නැති නිසා ය. ඊටත් වඩා ඉස්සර කාලෙ වාගේම ඉංග්‍රීසියෙන් කියන දේට අදත් වැඩි අවධානයක් යොමු වන නිසාය.

ඒ නිසාම මේ ලිපිය හමාර කරන්නට පෙර ඉංග්‍රීසි මහාචාර්යවරයකුගේ ප්‍රකාශයක් උපුටා දක්වමි. 2008 මාර්තු 08 වැනි ඉරිදා ලක්බිමට ලියන ලද ලිපියකින් ඒ අදහස දක්වන්නේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ මහාචාර්ය අරුජුන පරාක්‍රම ය.

"...මම විද්‍යාඥයෙක් නොහොත් මම වෛද්‍යවරයෙක් යයි කෙනකු කීවොත් මටත් ඒ කාර්යයම ඉතා හොඳින් කරන්නට පුළුවන් යයි එවැනිම කෙනකු මිස අවශේෂ කෙනකු කියන්නේ නැත. හේතුව ඒ සම්බන්ධයෙන් වෙනම විෂය ධාරාවක් හදාරා නිපුණත්වයක් ලැබිය යුතු නිසා ය. නමුත් භාෂාව සම්බන්ධයෙන් මේ තත්වය නැත. ඒ ලියන්නට,- කතා කරන්නට අපට පුළුවන්කම තිබෙන බැවිනි. ඒ අනුව භාෂාව සම්බන්ධයෙන් ද දැනුමක්, ශික්ෂණයක්, ඉගෙනීමක් අවශ්‍ය යයි බොහෝ දෙනා නොසිතති. නමුත් භාෂාව යනු එතරම් සුළු කොට නොතැකිය යුතු ඉතා සංකීර්ණ වූ දෙයක්.. "

ඔහු එසේ ඉංග්‍රීසිය ගැන කියන දේ නොතකන කෙනෙක් නැතැයි සිතමි. ඒ අදහස් සිංහලටත් අදාළ නොවන්නේ යැයි කිව හැකි ද?

ශ්‍රී ලංකාවේ කෙසේ වෙතත්, මේ රට ට සිංහලෙන් ලියන සීමිත පිරිස මෙබඳු අදහස් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇතැයි ද සිතිය හැකිය. දෙ රටේ ලේඛකයන් අතර පැහැදිලි වෙනසක් ඇති නිසාය. ශ්‍රී ලංකාවේ සිංහල ලියන සමහරෙක් රැකියාව උදෙසා එසේ කරන්නෝ ය. සිය රැකියාව මිසක් බස රැක ගැනීම ඔවුනගේ අරමුණ නොවේ. පත්තරකාරයන්ගෙන් බහුතරය මේ ගණයට දැමිය හැකිය. තවත් කෙනෙක් සිය

කැළණිය සරසවියේ සිංහල මහාචාර්යවරයා වියරණ වරද්ද වරද්දා ලියන අතර වාරයේ එම සරසවියේ ම ගණිතය පිළිබඳ මහාචාර්ය ධූරය හොබවන මෙම විද්‍යාඥයා - එනම් මහාචාර්ය නලින් ද සිල්වා වියරණ නොමරා විවිධ මාතෘකා යටතේ සතිපතා ලියන බව මම අවධාරණය කළෙමි.

මේ දෙදෙනාම මගේ පරපුරට ඇතුළත් කිරීමට මම නොකැමැත්තෙමි. මගේ පරපුරෙන් දැන් ඉතිරි වී ඇත්තේ ඉතා අල්ප ගණනකි. ඒ අතර ප්‍රකට සිවිල් සේවකයන් ද සිටි බව සඳහන් කළ යුතු ය. මා කියන සිවිල් සේවකයෝ සිංහල ලේඛකයෝ ය. මේ සියලු දෙනාම කතා බහේ දී යොදා ගත් ඉංග්‍රීසි කෑලි තිබුණ ද, යට කී ආකාරයට නිවැරදි බසින් ලියනවා හැරෙන්නට අනවශ්‍ය ඉංග්‍රීසි වචන හෝ යෙදුම් භාවිතයට නොපෙළඹුණ හ.

පාණ්ඩිත්‍යය ප්‍රදර්ශනය කරනු වස් ලියන්නෝ ය. පණ්ඩිතමානය නිසාම ඉන්පසු තවත් අලුතින් යමක් උගන්නට වුවමනාවක් -ආසාවක් නැත. ඒ නිසා තමා ලියන බසේ අඩුපාඩු නැතහොත් ඔපමට්ටම් කර ගත යුතු තැන් ඇතැයි සිතන්නට හෝ පිළිගන්නට පසුබට වීමද පුදුමයක් නොවේ. මෙසේ බලන කල බස ගැන දැනුම හා අත්හුරුව වර්ධනය කර ගැනීමට සිතන පිරිස අල්ප ය. ඔවුන් ඉදිරියේ මහා පවුරක් ලෙසින් පෙනී සිටින දැවැන්තයෝ ඇත. ඒ දැවැන්තයන් කරන කියන දේ ඉක්මවා යාම උගහට ය. එසේ යාමට තැත් කිරීම පවා තමන් රැහෙන් පන්නා දැමීමට හේතුවක් විය හැකි බව ද ඔවුන්ට පෙනී යයි. නිහඬ ව අර දවැන්තයන් අනුව ලිවීමට පුරුදු වීම පහසු හා හිතකර පිළිවෙළ බව ඔවුන් හිතාගත්තොත් එය ද පුදුමයක් නොවේ.

මේ රටේ මුදලට ලියන්නන් අතොත් ඒ ඉතා සීමිත පිරිසකි. ඔවුන් ලියන යමක් අතොත් අපට කියවන්නට ලැබෙන්නේ ද නැත. රාජකාරී කටයුතු වලට සීමා වන නිසා ය. අනෙක් බොහෝ දෙනා ලියන්නේ බසට ඇති ළැදියාව නිසා ය. තම තමන්ගේ ලේඛන හැකියාව වැඩි දියුණු කර ගැනීමේ අවංක චෙතනාවෙනි. එබඳු අරමුණකින් ලියන්නා තුළ බස කෙරෙහි ගරුත්වයක් පැවතීමද අනිවාර්යයෙන් සිදුවන්නකි. තමා ගරු කරන බස වඩ වඩාත් පිරිසිදු කරගෙන - රසවත් ආකාරයට ඉදිරිපත් කරන්නට ඔවුන් කැමති වනු ද නිසැකය. මේ රටේ අපේ ලේඛකයන් තමා ලියන බස ගැන වැඩි අවධානයක් යොමු කරන්නට ඉඩ ඇති බව මා සිතන්නේ මේ අනුව ය. එය එසේම වේවා! යි මම පතමි.

සිංහල කතාව සහ ලිවීම